# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1967/56 - 2016 මැයි මස 19 වැනි බ්‍රහස්පතින්දා - 2016.05.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය*: 3/4/71.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය*: LD/05/2006/HA/490.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ /පරවශතාවේ විස්තර :*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාදුරේ කෝරළේ, අංක: 565 උඩරොම්බුව ග්‍රාම නිලධාරි වසමේ උඩහොරොම්බුව ගමේ පිහිටි කුරුණෑගල මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද අ.ග.පි. 849 අතිරේක අංක 06 න් පෙන්නුම් කරන කට්ටි අංක: 282 හා 283.

1. **කැබලි අංක 282**

ඉඩමේ නම: හැඩිල්ලේහේන, හැඩිල්ලේහේන *නොහොත්* හැදිල්ලේවත්ත; හිමිකම් පාන්නාගේ නම සහ ලිපිනය: උඩහොරොම්බුව පදිංචි පල්ලේගෙදර ප්‍රේමාවතී; ප්‍රමාණය: හෙක්ටයාර් : 0.0042.

මායිම්:*උතුරට*: කැබලි අංක 91, 95, 174; *නැගෙනහිරට*: කැබලි අංක 174; *දකුණට*: කැබලි අංක 91, 283; *බටහිරට*: කැබලි අංක 283 .

2. කැබලි අංක 283

ඉඩමේ නම: හැඩිල්ලේවත්ත, පන්සලේ වත්ත, හැදිල්ලේහේන *නොහොත්* හැදිල්ලේවත්ත; හිමිකම් පාන්නාගේ නම සහ ලිපිනය: උඩහොරොම්බුව පදිංචි හඩිල්ලේගෙදර සෝමදාස; ප්‍රමාණය: හෙක්ටයාර් : 0.0271.

මායිම්:*උතුරට*: කැබලි අංක 91, 95, 174, 282; *නැගෙනහිරට*: කැබලි අංක 91, 95, 174, 282; *දකුණට*: කැබලි අංක 91, ; *බටහිරට*: කැබලි අංක 91.

ඉහත සඳහන් ඉඩමට පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2016 ජූලි මස 20 වැනි දින පූ.භා. 10.00 ට රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2016 ජූලි මස 13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම පරවශ්‍යතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එම්. එස්. එම්. නවාස්,
ප්‍රාදේශීය ලේකම්,
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
රිදීගම.

2016 මැයි මස 17 වැනි දින,
රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06 - 141


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*



1A - G 23496 - 27- (2016/05)

**සංශෝධනය**

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

2016.04.28 දිනැති අංක 1964/62 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* වෙරැස් ගඟ වැසි ජලය අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ දැන්වීමෙහි කැබලි අංක 13 හා 14 යන ඉඩම් කැබලිවල ප්‍රමාණයන් දෝෂ සහිතව මුද්‍රණය වී ඇති බැවින් පහත පරිදි සංශෝධනය විය යුතු වේ.

| *කැබලි අංකය* | *නිවැරදි වියයුතු ප්‍රමාණය* |
|---|---|
| 13 | හෙක්. 0.2672 |
| 14 | හෙක්. 0.2163 |

සී. ඩබ්. අබේසූරිය,
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
වෙරැස් ගඟ වැසි ජලය අපවහන හා පරිසර,
වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය.

06-142

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.